අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| මගේ යොමුව / எனது இல. / My Ref. | ED/2/29/18/27/01 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2026.06. 22 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංකය - 32/2025 (I)

සියලු ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**<u>ගුරු උපදේශක සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධව</u>**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 2025.10.28 දිනැතිව නිකුත් කරන ලද අංක 32/2025 දරන චක්‍රලේඛයේ 5 වන වගන්තිය ප්‍රකාරව පර්යේෂණ වාර්තා ඇගයීම කමිටුව විසින් නියමිත නිර්ණායකයන්ට අනුගත නොවන ලෙස සකස් කළ බවට හඳුනා ගනු ලබන වාර්තා සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය දක්වන, එකී චක්‍රලේඛයේ 06 වන වගන්තිය ප්‍රකාර කාර්යක්ෂමතා කඩඉම පැවැත්වීම සඳහා නිකුත් කරන ලද කාල රාමුව පහත පරිදි සංශෝධනය කරමි.

I. පර්යේෂණ නිබන්ධනය සකස් කර ඉදිරිපත් කිරීම පිළිබඳ කාල රාමුව

| අනු අංකය | කාරණය | කාලය |
|---|---|---|
| 01. | පර්යේෂණ යෝජනාව කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම | 2025.11.01 සිට 2025.11.30 දක්වා (මාස 01) |
| 02. | පර්යේෂණ නිබන්ධනය සකස් කර කමිටුව වෙත ඉදිරිපත් කිරීම | 2025.12.01 සිට 2026.11.30 දක්වා (මාස 12) |
| 03. | පර්යේෂණ නිබන්ධන ඇගයීම් කර කමිටුවේ නිර්දේශ ලබා දීම | 2026.12.01 සිට 2027.02.28 (මාස 03) |
| 04. | නියමිත නිර්ණායකයන්ට අනුකූල නොවන පර්යේෂණ වාර්තා නැවත නිලධාරියාට භාර දීමට | 2027.03.01 සිට 2027.03.31 දක්වා (මාස 01) |
| 05. | නියමිත නිර්ණායකයන්ට අනුකූල නොවන පර්යේෂණ වාර්තා නැවත නියමිත නිර්ණායකයන්ට අනුව සකස්කර ඉදිරිපත් කිරීමට | 2027.04.01 සිට 2027.06.30 දක්වා (මාස 03) |
| 06. | අවසන් පර්යේෂණ වාර්තාව ඇගයීමට ලක් කර නිර්දේශ ලබා දීම | 2027.07.01 සිට 2027.09.30 දක්වා (මාස 03) |

II. ඉහත කාල රාමුව අනුව අංක 03,04 හා 06 ප්‍රකාරව පර්යේෂණ නිබන්ධන භාරගැනීම්, හා කමිටුව් රැස්වී තීරණ නිකුත් කිරීම සම්බන්ධව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තු මට්ටමෙන් සකස් කර ගත යුතුය.

III. ඒ අනුව, පර්යේෂණ නිබන්ධන සකස්කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීමේදී අයදුම්කරු විසින් ඇමුණුම 01 ආකෘතිය භාවිත කළ යුතුය.

IV. උක්ත කාල රාමුවේ අනු අංක 02 හා 05 අනුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දෙනු ලබන පර්යේෂණ නිබන්ධනය භාර ගත් බවට ඇමුණුම 01 ආකෘතියෙහි II කොටස සම්පූර්ණ කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලබා දිය යුතු අතර, එය අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු වේ.

V. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉහත කාල රාමුවෙහි අනු අංක 04 පරිදි, නැවත සකස් කර ඉදිරිපත් කරන ලෙස තීරණය කරන පර්යේෂණ නිබන්ධන ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව අයදුම්කරු වෙත යොමු කළ යුතු අතර, අයදුම්කරු විසින් නිසි කාල සීමාව තුළ නැවත සකස් කර ඇමුණුම 01 ආකෘතිය මඟින් නැවතත් කමිටුවේ ඇගයීම සඳහා භාරදීම සිදුකළ යුතුය.

02. ඉහත 01. II ප්‍රකාරව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එක් එක් කලාපයට අදාලව නිලධාරීන් විසින් ඇගයීම සඳහා යොමුකරන නිබන්ධන හා ඒවා සම්බන්ධ අවසන් ඇගයීම් සහිත ඇමුණුම 03 ප්‍රකාර වාර්තාවක් 2027.11.30 දිනට ප්‍රථම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට පිටපතක් සහිතව අදාළ පළාත තුළ පිහිටි සියලු ම කලාප අධ්‍යාපන කාර්යාල වෙත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් යොමු කළ යුතු අතර, එකී වාර්තා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගුරු උපදේශක සේවයේ නිලධාරීන්ගේ උසස්වීම් සම්බන්ධ කටයුතු වලදී පළමු කාර්යක්ෂමතා කඩඉම් ප්‍රතිඵල සත්‍යාපනය සඳහා අදාල කර ගත යුතුය.

03. ඒ අනුව ඉහත සඳහන් කරුණු හැර අංක 32/2025 දරන චක්‍රලේඛයෙහි අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතී.

නාලක කලුවැව
ලේකම්

ඇමුණුම 01

I කොටස

(නිලධාරියාගේ නම)

(නිලධාරියාගේ තනතුර)

(කලාපය)

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

............ පළාත

**ගුරු උපදේශක සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - පර්යේෂණ නිබන්ධනය භාර දීම / ................ දිනැතිව කළ දැනුම් දීම පරිදි සංශෝධනය කර නැවත භාර දීම (අදාල නොවන වගන්තිය කපා හරින්න)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2182/36 හා 2020.07.01 දිනැති ගුරු උපදේශක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වන ඡේදයේ සඳහන් පරිදි ගුරු උපදේශක සේවයේ II වන පන්තියේ නිලධාරියකු විසින් සම්පූර්ණ කළ යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාලව මා විසින් ඉදිරිපත් කරනු ලබන .........(පර්යේෂණ නිබන්ධනයේ නම) පර්යේෂණ නිබන්ධනය ඇගයීම් කමිටුව වෙත මේ සමඟ භාර දෙමි.

අත්සන :- දුරකථන අංකය :-

දිනය :-

................................................................................................................................

නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට යොමු කරන පිටපත II කොටස

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

(කලාපය)

............................................ (නිලධාරියාගේ නම, තනතුර, කලාපයේ නම) විසින් ........................ .............. නමින් ඉදිරිපත් කර ඇති පිටු ...... සමන්විත (...... මාස) පර්යේෂණ නිබන්ධනය / නැවත සකස් කර නිබන්ධනය ඇගයීම සඳහා භාරගන්නා ලදී.

..........(අත්සන)...................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියකු

දිනය :- නිල මුද්‍රාව :-

ඇමුණුම 02

(නිලධාරියාගේ නම)

(නිලධාරියාගේ තනතුර)

(කලාපය)

ගුරු උපදේශක සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

......(දිනය).......... දිනැතිව ඔබ විසින් අප වෙත භාර දෙනු ලැබූ .........(නිබන්ධනයේ නම) ................................ මැයෙන් ඉදිරිපත් කර ඇති පර්යේෂණ නිබන්ධනය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 32/2025 හි සඳහන් නිර්ණායකයන්ට අනුකූල නොවන බැවින් එම නිර්ණායකයන්ට අනුව නැවත සකසා ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ ඔබ වෙත භාර දෙමි.

02. තවදුරටත් පර්යේෂණ නිබන්ධණයට ඇතුළත් විය යුතු කරුණු පිළිබඳ කමිටුවේ නිරීක්ෂණ / නිර්දේශ සැකෙවින්

i. ...
ii. ...
iii. ....

03. ඒ අනුව ඉහත 02. ඡේදයේ නිරීක්ෂණ / නිර්දේශයන්ට අනුව සම්පූර්ණ කරන ලද පර්යේෂණ නිබන්ධනය නියමිත දිනට සම්පූර්ණ කර මා වෙත නැවත භාර දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

..........................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / වෙනුවට

දිනය :-

පිටපත - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ............කලාපය - කරු. නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා

ඇමුණුම 03

(රහසිගත)

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (කලාපය) වෙත

ගුරු උපදේශක සේවයේ 2027.11.30 දිනට පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ අවසන් ඇගයීම් වාර්තාව අනුව ඔබ කලාපයේ සේවය කරන නිලධාරීන්ගේ ප්‍රතිඵල ලේඛන පහත ඇමුණුම I මඟින් ඉදිරිපත් කරමි.

ඇමුණුම I

| අනු අංකය | නිලධාරියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | පර්යේෂණ නිබන්ධනයේ නම | පර්යේෂණ නිබන්ධනය කමිටුව විසින් අනුමතකර | | අනුමැතිය ලබා දෙන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| | | | | ඇත | නැත | |
| | | | | | | |

.........................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

දිනය :-

පිටපත :- ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.